පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - බුද්ධ ධර්මය

සතිය- 06

ශ්‍රේණිය - 10

Prepared by- ඒ.වී. චමින්ද විජේකුමාර ආරියදාස

බෞද්ධ සාහිත්‍ය රස විඳිමු

- **කෙටි පිළිතුරු ලියන්න.**

1. මෙරට පැරණි ම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති වශයෙන් සැලකෙන්නේ මොනවා ද?
2. අනුරාධපුර යුගයට අයත් පැරණි ම සිංහල පද්‍ය නිර්මාණ හමුවන්නේ කුමන ස්ථානයෙන් ද?
3. අනුරාධපුර යුගයට අයත් දැනට ශේෂ වී ඇති කෘති තුනක් නම් කරන්න.
4. බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්මසාරථී ගුණය වර්ණනා කරමින් ගුරුළුගෝමී පඬිතුමා විසින් රචනා කරන ග්‍රන්ථය කුමක් ද?
5. “ බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු” යනුවෙන් සෑම ඡේදයක් ම අවසානයේ දක්වමින් බුදුරදුන්ගේ නව අරහාදී ගුණ වර්ණනා කරමින් පොළොන්නරු සාහිත්‍ය යුගයෙහි රචනාකර ඇති ග්‍රන්ථය හා එහි කතුවරයා සඳහන් කරන්න.
6. සිංහලයෙන් රචනා වූ පැරණි ම ගී කාව්‍ය දෙක නම් කර එම කාව්‍ය දෙකට වස්තු විෂය වී ඇති ජාතක කතා නම් කරන්න.
7. මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමිපාණන් විසින් පූජාවලිය රචනා කරනු ලැබුවේ බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ අතරින් කිනම් බුදුගුණය පදනම්කරගෙන ද?
8. “සද්ධර්මය නමැති මිණිකැට ඇමිණූ මාලය” යන අරුත ගෙනෙන සද්ධර්ම රත්නාවලිය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
9. භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන දෙවන පැරකුම්බා නිරිඳුන් විසින් රචනාකළ සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍යය කුමක් ද?
10. දඹදෙණි සාහිත්‍ය යුගයට අයත් ගද්‍ය කෘති අතර දක්නට ඇති තිසරණ පොත් තුන නම් කරන්න.

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. පැරණි සාහිත්‍ය කෘති පරිශීලනයෙහි ඇති වැදගත්කම කරුණු පහකින් දක්වන්න.
2. පහත සඳහන් මාතෘකා සඳහා කෙටි සටහන් ලියන්න.
   i. අනුරාධපුර සාහිත්‍ය යුගය
   ii. සද්ධර්ම රත්නාවලිය
   iii. කව්සිළුමිණ
   iv. පූජාවලිය